# පාරිසරික සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීමට යොදා ගැනීමේ දී සිදු වන පරිසර හානි පිළිබඳ අධ්‍යයනයක්

*ජේ.ඒ.එස්.එන්. කුමාර [1] ඒ.එම්.වී.පී.ඩබ්ලිව්. අබේකෝන් [2]*

ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටකට පාරිසරික සංචාරක කර්මාන්තය අත්‍යන්තයෙන් ම සම්පතක් වුවත් තුළින් ආර්ථිකය ශක්තිමත් කිරීමට යොදා ගැනීමේ දී පරිසරයට එමගින් සිදුවන අහිතකර බලපෑම් ඉතා ඉහළ ය. ඒ අනුව මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණ වන්නේ පාරිසරික සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීමට යොදා ගැනීමේ දී සිදු වන පරිසර හානි හඳුනාගෙන ඒවාට අවශ්‍ය පිළියම් යොදා තිරසාර පාරිසරික සංචාරක කර්මාන්තයක් ස්ථාපිත කිරීමයි. පර්යේෂණයට අදාළ ප්‍රාථමික දත්ත මීමුරේ, මිහින්තලේ, ත්‍රිකුණාමලය, මීයන් ඇල්ල, නාරංගල, ගලමුදුන, හන්තාන කඳුවැටිය යන සංචාරක ස්ථානවල සංචාරය කරමින් සහභාගිත්ව නිරීක්ෂණ ක්‍රමය, සම්මුඛ සාකච්ඡා මගින් රැස් කර ගැනිණි. පොත්, සඟරා, පර්යේෂණ පත්‍රිකා සහ අන්තර්ජාලය යන ද්විතියක මූලාශ්‍රය මගින් ද අදාළ දත්ත රැස් කර ගැනිණි. පාරිසරික සංචාරක කර්මාන්තය පදනම් කරගෙන මූලික ව ම ස්වභාව සෞන්දර්යය විඳීම, කඳවුරු බැඳීම, කඳු නැගීම්, වන සතුන් කුරුල්ලන් නැරඹීම, ගම්බද ප්‍රදේශවල සංචාරය, ආදී විවිධ සංචාරක ක්‍රියාකාරකම් සිදු කරයි. පාරිසරික සංචාරක කර්මාන්තයේ දී ස්වභාවධර්මය මත පදනම් ව තිරසාර කළමනාකරණයකින් සංචාරක ව්‍යාපාර කටයුතුවල නියැළීම නොවුණ හොත් ස්වභාවික පරිසරය විනාශ වනු ඇත. ශ්‍රී ලංකාවට ආවේණික ශාක හෝ ශාක කොටස්, සතුන් වෙනත් රටවලට අපනයනය, සංචාරක ස්ථානවල අපද්‍රව්‍ය බැහැරලීමට නිසි ක්‍රමවේදයක් නොමැතිවීම, ඉඩම් හායනය, පාංශු ඛාදනය, කොරල් පර සහ මුහුදු ජීවීන් විනාශය, සමරු තිළිණ සෑදීමට ස්වභාවික සම්පත් බහුලව භාවිතය, පාරිසරික සංචාරක ස්ථාන නැරඹීමට එන සංචාරකයන් ප්‍රමාණය වැඩි වීමෙන් පරිසර සමතුලිතතාව බිඳවැටීම, සංස්කෘතික කාරණා ස්වභාවික පරිසරය සමග බද්ධ කිරීමෙන් වැරදි මතවාද සංචාරකයන් අතර ප්‍රචාරය වීම ආදීය එලෙස උද්ගත ව ඇති ගැටලු වේ. ජෛව විවිධත්වයෙන් හා සංස්කෘතික උරුමයන්ගෙන් පොහොසත් ශ්‍රී ලංකාවේ පාරිසරික සංචාරක ව්‍යාපාරය නඟා සිටුවමින් පරිසර හානි වැළැක්වීමට පාරිසරික සංචාරක මුලපිරීම් සදහා ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය, ස්වාභාවික පරිසර පද්ධති ආරක්ෂා කිරීම, වගකිවයුතු වනජීවී සංචාරක ව්‍යාපාරය දිරිමත් කිරීම, සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳ ව ප්‍රජාව දැනුවත් කිරීම, පරිසර හිතකාමී ප්‍රවාහන විකල්ප ප්‍රවර්ධනය, අඩු බලපෑම් සහිත සංචාරක ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය, ආධාර සංචාරක ව්‍යාපෘති ප්‍රවර්ධනය, පාරිසරික බලපෑම් අවම කිරීම, සංචාරක පරිමාව කළමනාකරණය, සංචාරක කටයුතු අධීක්ෂණය, පර්යේෂණය වැනි යෝජනා ඉදිරිපත් කළ හැකි අතර එමගින් තිරසාර පාරිසරික හිතකාමී සංචාරක කර්මාන්තය රටේ ආර්ථිකයට නිසැක ව ම ශක්තියක් වනවා සේ ම පරිසරයට ද හිතකාමී වන බව මෙම අධ්‍යනයෙන් පැහැදිලි විය.

***ප්‍රමුඛ පදඃ*** ශ්‍රී ලංකාව, පරිසරය, සංචාරක කර්මාන්තය, ශ්‍රී ලංකාවේ ආර්ථිකය, පාරිසරික සෞන්දර්යය

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය. sanjaya.nayanakumara98@gmail.com

[2] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය. ssh2020005@ssh.rjt.ac.lk